(ආ) කාර්යය මණ්ඩලය පිළිබඳ තොරතුරු

**I. වෘත්තිමය කාර්යය මණ්ඩලය (Professioñl Staff) [C9 සහ C8 ශ්‍රේණි සඳහා වෘත්තිමය කාර්යය මණ්ඩලයඅවශ්‍ය නොවේ]**

C7 සහ C6 සඳහා වෘත්තිමය කාර්යය මණ්ඩලය යටතේ ලකුණු 2ක් ලබා ගත යුතු බැවින් ඔබ හෝ ඔබ ආයතනයේ කොටස්කරුවන් අතර එවැනි පුද්ගලයින් සිටිනම් ඔවුන්ගේ අධ්‍යාපන හා සේවා සහතික වල පිටපත් ඉදිරිපත් කර එය සනාථ කළ හැක. එසේ නොමැති නම් ඔබට උපදේශකවරයෙකුගේ සේවය ලබා ගැනීමට සිදුවන අතර තුන් අවුරුදු කාල සීමාවක් සඳහා එවැනි උපදේශකවරයකු සමග ඇති කරගනු ලබන ගිවිසුමක් සමග ඔහුගේ කැමැත්ත ප්‍රකාශිත ලිපියක් (අයදුම්පතට අමුණා ඇත) හා ඔහුගේ අධ්‍යාපන සුදුසුකම් ඉදිරිපත් කළ යුතු වේ. එවැනි උපදේශකවරයෙක් සඳහා දෙනු ලබන ලකුණු ප්‍රමාණය 2 කට සීමා වන අතර, ඔහු කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම, ශ්‍රේණිගතකිරීම හා අධීක්ෂණය කිරීම සඳහා වන කාර්යෝපදේශයේ (CIDA/ID/10-M) 1 වෙනි ඇමුණුමෙහි (පිටු අංක 27-31) සඳහන් කර ඇති පරිදි ඉංජිනේරු සහකාර හෝ ඊට ඉහළ ශ්‍රේණියකට අයත් විය යුතුය.

මේ සඳහා ඔබට ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන්ගේ සංගමයේ ශාඛා කාර්යාලවලට අනුයුක්ත කර ඇති ඉංජිනේරුවරයන්ගේ සේවයද ලබා ගත හැකිය.

**II අධීක්ෂණ කාර්ය මණ්ඩලය :- (Supervisory Staff)**

කොන්ත්‍රාත්කරුවන් වසර 5ට වඩා ඉදිකිරීම් ක්ෂේත්‍රයේ පළපුරුද්ද ලබා තිබේ නම් හෝ සිඩා ආයතනය විසින් කොන්ත්‍රාත්කරුවන් දැනුවත් කිරීම සඳහා පවත්වනු ලබන පාඨමාලාව සාර්ථක ලෙස හැදෑරීමෙන්ද මේ යටතේ එක් ලකුණක් ලබා ගත හැක. අමතර ලකුණු ලබා ගැනීම සඳහා කොන්ත්‍රාත්කරුවන් වෙත ස්ථිර සේවයේ යෙදී සිටින අධීක්ෂණ කාර්යය මණ්ඩලය සිටිය යුතුවේ. එම අධීක්ෂණ නිලධාරීන් ලබා තිබිය යුතු සුදුසුකම් ඉහත සඳහන් අත් පොතෙහි (CIDA/ID/10-M) 1 වන ඇමුණුමෙහි කාර්මික සහකාර හා එයට පහළ කාණ්ඩයන් හි දක්වා තිබේ.

**පළපුරුද්ද :-**

(අ) ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුයෙකු ලෙස ලබා ඇති පලපුරුද්ද වෙනුවෙන් ලකුණු ලබා ගැනීම සඳහා කොන්ත්‍රාත්කරුවෙකු සිඩා වර්තා පොතෙහි අදාල පිටුවල (පිටු අංක 34-80) සේවා දායකයින් විසින් තබා ඇති සටහන් සමග පහත සඳහන් තොරතුරු ඉදිරිපත් කළ යුතුය

1. විවිධ රාජ්‍ය ආයතනයන්හි කොන්ත්‍රාත් කටයුතුවල යෙදීම සඳහා ලබා ඇති ලියාපදිංචිය පිළිබඳ තොරතුරු.
2. විවිධ රාජ්‍ය ආයතන විසින් නිකුත් කර ඇති කොන්ත්‍රාත්කරුවන්ගේ වාර්තා පොත්.
3. ගිවිසුම් හා වැඩ නිම කිරීමේ සහතික.

(ආ) පසුගිය වසර 5 කාලය තුළ කරන ලද වැඩ පිළිබඳ තොරතුරු
රාජ්‍ය ආයතනයන්හි කොන්ත්‍රාත් කටයුතු වල යෙදී සිටියේ නම් එම ආයතන විසින් විසින් නිකුත් කරන ලද වැඩ අවසන් කිරීමේ සහතික ඉදිරිපත් කළ හැක. පෞද්ගලික අංශයේ වැඩ ගැන සලකා බලනු ලබන්නේ එම වැඩ සඳහා වැඩ නිම කිරීම සනාථ කරමින්, එහි වටිනාකමද ඇතුලත්ව සුදුසුකම්ලත් උපදේශකවරයෙකුගෙන් නිකුත්කල සහතිකපත් ඇතිනම් පමණි.

(ආ) නිම කරන ලද විශාලම ව්‍යාපෘති පිළිබඳ තොරතුරු
මේ සඳහා ඔබ විසින් එක් එක් ක්ෂේත්‍රය යටතේ පසුගිය අවුරුදු 5 ක කාලය තුළ තනා නිම කරන ලද විශාලම ව්‍යාපෘති පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ.

**වෙනත් කරුණු :-**

වාර්තා පොත ලබා ගැනීම සඳහා (පලමු පොත ලබාගන්නා විට පමණක්) සෑම විටම අයිතිකරු පැමිණිය යුතු වේ. වාර්තා පොත සතියේ වැඩ කරන දින වල සංවර්ධන අංශයෙන් සවස 3.00ට පෙර ලබා ගත හැක.

**නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය**

## ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය (CIDA)

**ජාතික ලියාපදිංචි වීමේ ක්‍රමය යටතේ**
**ඉදිකිරීම් කොන්ත්‍රාක්කරුවෙකු ලෙස**
**සිඩා ආයතනයේ ලියාපදිංචිය**
**ලබා ගැනීම පිළිබඳ උපදෙස්**

# C6 සිට C9 වන ශ්‍රේණි දක්වා

2016 මැයි මුද්‍රණය

**ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය (CIDA)**
"සව්සිරිපාය"
123, විජේරාම මාවත
කොළඹ 07.

දුරකථන : 2699801, 2695965, 2686092
ෆැක්ස් : 2686089
විද්‍යුත් තැපැල : cida@sltnet.lk
වෙබ් : www.cida.lk

**<u>සිඩා ආයතනයේ ලියාපදිංචිය ලබා ගන්නේ කෙසේද</u>**

1. ඔබේ ව්‍යාපාරය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක හෝ ව්‍යාපාර නාම රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචි කර ඒ සඳහා නිකුත් කරනු ලබන සහතිකයක් ලබා ගත යුතුය. ව්‍යාපාරයේ ස්වාභාවය ලෙස "සියළු ඉදිකිරීම් කටයුතු" යනුවෙන් එහි සඳහන් කිරීම අවශ්‍ය වේ. "ප්‍රජා පාදක සංවිධාන" (Community Based Organizations) එම ආයතනය ස්ථාපිත කිරීම සඳහා අදාල වූ රජය ආයතනය මගින් නිකුත් කල වලංගු සහතිකයක් ඉදිරිපත් කල යුතුය.

2. ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම, ශ්‍රේණි ගත කිරීම සහ අධීක්‍ෂණය කිරීම සඳහා වන අයදුම්පත ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ තොරතුරු මධ්‍යස්ථානයෙන් රුපියල් 400/= ක් ගෙවා ලබාගත හැක. තැපෑලෙන් ගෙන්වා ගන්නේනම් පහත දැක්වෙන පරිදි සම්පූර්ණ මුදල ගෙවීමෙන් ලබාගත හැක.
   - (අ) සභාපති - ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය නමින් බැංකු අනකරයකින්, නියමිත මුදල ගෙවීමෙන්

     **හෝ**

   - (ආ) ලංකා බැංකුවේ ටොරින්ටන් ශාඛාවේ අංක 77454975 ගිණුමට මුදල් බැරකරන ලද ලදුපත, ලිපියක් සමඟ අධ්‍යක්‍ෂක (සංවර්ධන) - ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවීමෙන්

     {ලියාපදිංචි කිරීමේ පටිපාටිය - රු. 680/-, අයදුම්පත - රු. 400/-, ලියාපදිංචි තැපැල් ගාස්තුව - එක් ප්‍රකාශනයක් සඳහා රු. 85/-, ප්‍රකාශන දෙකම සඳහා රු. 95/- (තම අවශ්‍යතාවය පරිදි මුළු මුදලම ගෙවා තිබිය යුතුවේ.)}

3. ඉල්ලුම් පත්‍රය සම්පූර්ණ කර, ව්‍යාපාර ලියාපදිංචි සහතිකයේ, ජාතික හැඳුනුම්පතේ, ඔබේ මූල්‍ය හැකියාවන් සනාථ කිරීමේ ලිපිවල හා ඔබේ හැකියාවන් සහ පළපුරුද්ද සනාථ කරන ලිපිවල ඡායා පිටපත් ද සමග, මෙම ආයතනයේ තොරතුරු මධ්‍යස්ථානය වෙත ඉදිරිපත් කරන්න. ඔබ ඉදිරිපත් කරන තොරතුරු හා ඡායා පිටපත් වල අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා එම පිටපත් නීතීඥවරයෙකු හෝ නොතාරිස්වරයෙකු විසින් සහතික කළ යුතු අතර, අයදුම්පත්‍රයේ II වන ඇමුණුමෙහි ඇති දිවුරුම් ප්‍රකාශනය ද සම්පූර්ණ කළ යුතුය.

4. ඔබට ලබාගත හැකි කොන්ත්‍රාත්තුවල ඉහලම වටිනාකම තීරණය වන්නේ ලැබෙන ශ්‍රේණිය අනුවය. එක් එක් ශ්‍රේණියට අදාල ඉහල වටිනාකම පහත දක්වේ.

   C9 වන ශ්‍රේණිය - මිලියන 2 දක්වා
   C8 වන ශ්‍රේණිය - මිලියන 2 සිට මිලියන 5 දක්වා
   C7 වන ශ්‍රේණිය - මිලියන 5 සිට මිලියන 10 දක්වා
   C6 වන ශ්‍රේණිය - මිලියන 10 සිට මිලියන 25 දක්වා

5. මෙම ශ්‍රේණිගත කිරීම කරනු ලබන්නේ කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම, ශ්‍රේණිගතකිරීම හා අධීක්ෂණය කිරීම සඳහා වන කාර්යෝපදේශයේ අඩංගු උපදෙස් අනුවය. ඒ අනුව එක් එක් ශ්‍රේණිය සඳහා අදාල උපරිම ලකුණු ප්‍රමාණය මෙන්ම, විවිධ අවශ්‍යාතාවයන් සඳහා නියම කර ඇති අවම ලකුණු ප්‍රමාණයන්ද ලබා ගත යුතුය. එම විස්තර පහත දක්වේ.

| ශ්‍රේණිය | ලබා ගත යුතු අවම ලකුණු ප්‍රමාණය | | | | | | ලබා ගත යුතු මුලු ලකුණු | වසරකට ලි.ප. ගාස්තුව රු. | අයදුම්පත සැකසීමේ ගාස්තුව රු. |
|---|---|---|---|---|---|---|---|---|---|
| | මූල්‍ය පහසුකම් | | වෘත්තීමය නිලධාරීන් | අධීක්ෂණ නිලධාරීන් | කාර්යය පලපුරුද්ද | | | | |
| | | | | | අවසාන වසර 5 තුල | විශාලතම ව්‍යාපෘතිය | | | |
| | රු. මිලියන | ලකුණු | ලකුණු | ලකුණු | ලකුණු | ලකුණු | | | |
| C9 | 0.16 | 0.4 | - | 1.0 | - | - | 1.4 | 6,000+Vat | 500+Vat |
| C8 | 0.4 | 1.0 | - | 1.0 | - | - | 2.0 | 8,000+Vat | 500+Vat |
| C7 | 0.8 | 2.0 | 2.0 | 1.0 | - | - | 5.0 | 15,000+Vat | 500+Vat |
| C6 | 2.0 | 3.0 | 2.0 | 2.5 | 1.5 | 1.5 | 11.0 | 20,000+Vat | 2000+Vat |

C6 ශ්‍රේණිය යටතේ ලියාපදිංචිය අපේක්ෂා කරන කොන්ත්‍රාත්කරුවන් පසුගිය වසර 5 තුළ කරන ලද වැඩ සඳහා ලකුණු 1.5 ක්ද තමන් ලියාපදංචිය අපේක්ෂා කරන එක් එක් ශ්‍රේණීන් යටතේ නිම කරන ලද විශාලම ව්‍යාපෘති සඳහා ලකුණු 1.5 ක්ද (රු. මිලියන 6.0) අනිවර්යයෙන්ම ලබා ගත යුතුය.

6. ඉහත වගුවේ දක්වා ඇති ලකුණු ලබා ගැනීම සඳහා පහත සඳහන් ලියවිලි ඉදිරිපත් කළ හැක.

**(අ) මුල්‍යමය :- (Financial Ability)**

i. විගණනය කරන ලද වාර්ෂික ගිණුම් ප්‍රකාශන (C6 ශ්‍රේණිය සඳහා අනිවාර්යයෙන්ම ඉදිරිපත් කළ යුතුය)

ii. එක් එක් ශ්‍රේණි යටතේ කොන්ත්‍රත්කරු සතුව තිබිය යුතු මූල්‍ය හැකියාවන් අවම වශයෙන් පහත් සඳහන් පරිදි විය යුතුය.

C9 රුපියල් 160,000/-
C8 රුපියල් 400,000/-
C7 රුපියල් 800,000/-
C6 රුපියල් 2.000,000/-

මෙම ප්‍රමාණයන්ට වඩා හැකියාවන් පෙන්විය හැකි නම් ඒ සඳහා වැඩිමනත් ලකුණු ලැබෙනු ඇත.

iii. මූල්‍යමය අවශ්‍යතාවයන් පහත සඳහන් අයුරින් සපුරා ගත හැක.

- ඉතිරි කිරීමේ ගිණුම - මෙහි මාස තුනක (3) ඉතිරියෙහි මධ්‍යය අගය පදනම් කරගනු ලැබේ. එබැවින් පාස් පොතේ පිටපතක් අයදුම් පත සමඟ ඉදිරිපත් කරන්න.
- ජංගම ගිණුම් වලදී පසුගිය මාස 6 තුළ පැවති උපරිම සහ අවම ශේෂයන් වල මධ්‍යය අගය සැලකිල්ලට ගනු ලබන බැවින් පසුගිය මාස 6 සඳහා මාසික ගිණුම් වාර්තා ඉදිරිපත් කරන්න.
- ස්ථිර තැන්පතු - අවම වශයෙන් මාස 6ක කාලයක් සඳහා යොදවන ලද තැන්පතුවිය යුතුය. සහතිකයේ පිටපතක් ඉදිරිපත් කරන්න.
- ඔබට ප්‍රදානය කර ඇති ස්ථිර බැංකු අයිරා පහසුකම්
- දිසා ලේකම්ගෙන් ලබා ගත් වත්කම් සහතික සලකා බලනු ලබන්නේ C9 සිට C7 ශ්‍රේණීන් සඳහා සහ ඔබ ඉල්ලා සිටින ශ්‍රේණියට අවශ්‍ය අවම මූල්‍ය අවශ්‍යතාවයෙන් භාගයක් (½) සපුරාලීමට පමණකි. අනිත් භාගය සඳහා වෙනත් මූල්‍ය පහසුකමක් තිබිය යුතුය. (වත්කම් සහතික වල වටිනාකමින් භාගයක් පමණක් අවශ්‍ය ලකුණු සඳහා පිළිගනු ලැබේ.)

| ශ්‍රේණිය | වත්කම් සහතික (රු) | වෙනත් පහසුකම් |
|---|---|---|
| C9 | 160,000/- | 80,000/- |
| C8 | 400,000/- | 200,000/- |
| C7 | 800,000/- | 400,000/- |